# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 10 දරන
# යුද හමුදා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: ශත 45 යි. තැපැල් ගාස්තුව: රු. 1.00 යි.

# 1993 අංක 10 දරන යුද හමුදා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 24/91

**යුද හමුදා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:— **ලුහුඬු නාමය.**

1. මේ පනත 1993 අංක 10 දරන යුද හමුදා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. 357 වන අධිකාරයේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) යුද හමුදා පනතේ 27 වන වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අඅ) (i) නිශ්චිත වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටවනු ලැබුවේ යම් කාලසීමාවක් තුළද ඒ කාලසීමාව සම්බන්ධයෙන් වූ සියලු වැටුප් සහ දීමනා; සහ,

(ii) වෙන යම් වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ එක් එක් මාසයේ යම් කාලසීමාවක් තුළද නියම කරනු ලැබිය හැකි ඒ ඒ මාසය සඳහා වූ ඔහුගේ වැටුපෙන් හා දීමනාවලින් කොටසක්.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:—

"(අඅ) (i) නිශ්චිත වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු ඔහු සිය ධුරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ යම් කාල සීමාවක් තුළද ඒ කාලසීමාව සම්බන්ධයෙන් වූ සියලු වැටුප් හා දීමනා; සහ

2—ඩ 024044—5,705 (92/10)

(ii) වෙන යම් වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරන ලද අධිකරණමය හෝ විනයානුකූල නඩු කටයුතු නිමවන තුරු, ඔහු සිය ධූරයේ කටයුතු කිරීමෙන් අත්හිටුවනු ලැබුවේ එක් එක් මාසයේ යම් කාලසීමාවක් තුළද නියම කරනු ලැබිය හැකි ඒ ඒ මාසය සඳහා වූ ඔහුගේ වැටුපෙන් සහ දීමනාවලින් කොටසක් ;".

(2) ඒ උපවගන්තියේ (1) වන අතුරු වගන්තියේ "ඒ අඩු කිරීමේ මුළු මුදල" යන වචන වෙනුවට, "මේ උපවගන්තියේ (අ), (අඅ), (අඅඅ) (ii), (ආ), (ඇ), (ඈ), (ඉ), (ඊ) සහ (උ) ඡේද මගින් බලය දෙන ලද ඒ අඩු කිරීම්වල මුළු මුදල" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.